# ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය
# இலங்கை கம்யூனிஸ்ட் கட்சி
# COMMUNIST PARTY OF SRI LANKA

91, Dr. N.M. Perera Mawatha, Colombo-08, Sri Lanka -Telephone: 0112695328 Fax: 0112691610
E-mail: compartysl@gmail.com


මාධ්‍ය නිවේදනය

## විශ්‍රාමික මේජර් ජෙනරාල් සුරේෂ් සලේ අඛණ්ඩව රඳවා තබා ගැනීම පිළිබඳව ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය දැඩි කනස්සල්ල පළ කරයි!

පෙබරවාරි 25 වන දින අත්අඩංගුවට ගෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) යටතේ දින 95 කට වැඩි කාලයක් රඳවා තබාගෙන සිටින හිටපු බුද්ධි අංශ ප්‍රධානී විශ්‍රාමික මේජර් ජෙනරාල් සුරේෂ් සලේ අඛණ්ඩව රඳවා තබා ගැනීම පිළිබඳව ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂය (CPSL) සිය ගැඹුරු කනස්සල්ල පළ කරයි.

මේජර් ජෙනරාල් සලේගේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මුල් රඳවා තබා ගැනීම දින 90 ක් වූ අතර ඉන් පසුව කොළඹ මහේස්ත්‍රාත්වරයා ඔහුගේ රැඳවුම් කාලය දීර්ඝ කළේය. "ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) ඇතුළු සියලු පීඩාකාරී ක්‍රියාවන් අහෝසි කිරීම සහ රටේ සෑම ප්‍රදේශයකම ජනතාවගේ සිවිල් අයිතිවාසිකම් සහතික කිරීමට" පාලක ජාතික ජන බලවේගයේ (NPP) 2024 ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් ("සමෘද්ධිමත් ජාතියක්, සුන්දර ජීවිතයක්") පොරොන්දු වූ බව කොමියුනිස්ට් පක්ෂය සටහන් කරයි.

### අයුතු ලෙස සැලකීම සහ ක්‍රියා පටිපාටිමය අක්‍රමිකතා පිළිබඳ චෝදනා

මේජර් ජෙනරාල් සලේ අත්අඩංගුවේ සිටියදී ශාරීරික තුවාල සහ දැඩි මානසික පීඩාවන්ට ලක්ව ඇති බවට නීති උපදේශකයින් සහ වෛද්‍ය නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද වාර්තා පිළිබඳව කොමියුනිස්ට් පක්ෂය කනස්සල්ලට පත්ව සිටී. අධිකරණ වෛද්‍ය නිලධාරියාගේ වාර්තාවෙන් මේජර් ජෙනරාල් සලේට පශ්චාත් කම්පන ආතති ආබාධ, සාංකාව සහ මානසික අවපීඩනය ඇති බව හඳුනාගෙන ඇති බවත්, ඔහුගේ ශරීරයේ ස්ථාන පහක තුවාල හඳුනාගෙන ඇති බවත් ජනාධිපති නීතිඥ ශවින්ද්‍ර ප්‍රනාන්දු අධිකරණයට දැනුම් දුන්නේය. නීතිඥවරයා පවසන පරිදි, වධහිංසා පැමිණවීමක් සිදුවී ඇති බවට, වාර්තාවෙන් චෝදනා එල්ල වේ.

ප්‍රමාණවත් ආහාර නොමැතිකම, මූලික සනීපාරක්ෂාව නොමැතිකම සහ වෙනත් අමානුෂික තත්වයන් සම්බන්ධයෙන් මනෝරි සලේ මහත්මිය පොලිස්පතිවරයා වෙත විධිමත් පැමිණිල්ලක් ගොනු කර ඇත. අධිකරණ ඉදිරියා ප්‍රකාශ වූයේ මේජර් ජෙනරාල් සලේට නිසි ආහාර ලබානොදෙන බවත්, එක් රාත්‍රියක සිර මැදිරියේ තබා ඇති පුවත්පත් කැබැල්ලකට හොදි සමඟ බත් පිළිගැන්වූ බවත්ය. මාධ්‍ය වාර්තාවලින් පෙනී යන්නේ තවත් සමහර රැඳවියන්ට ආහාර ලබාගැනීමට අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුවේ ආපන ශාලාවට ප්‍රවේශ වීමට අවසර දී ඇති බවයි.

අපරාධ සහ ත්‍රස්තවාදී ක්‍රියා විමර්ශනය කිරීමේදී සහ නඩු පැවරීමේදී නීත්‍යානුකූල ක්‍රියා පටිපාටියේ අවශ්‍යතාවය කොමියුනිස්ට් පක්ෂය පිළිගනී. ඒ සමඟම, මෙම සිද්දියට අදාලව නිසි ක්‍රියා පටිපාටිය

අනුගමනය කර ඇත්තේද යන සැකය මතුවෙමින් ඇත. මෙම අඩුපාඩු නිසා අත්අඩංගුවට ගැනීම සහ අඛණ්ඩව රඳවා තබා ගැනීම දේශපාලනික වශයෙන් වූ කරුණු නිසා විය හැකි බවට ඇති කනස්සල්ල තවත් ශක්තිමත් වේ.

**මර්දනයේ මෙවලමක් ලෙස ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත**

මානව හිමිකම් සංවිධාන දිගු කලක් තිස්සේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, නඩු විභාගයකින් තොරව දිගුකාලීන අත්තනෝමතික රඳවා තබා ගැනීමට පහසුකම් සපයන සහ වධහිංසා පැමිණවීමට සහ බලහත්කාරයෙන් පාපොච්චාරණය කිරීමට අවස්ථා නිර්මාණය කරන කුරිරු ව්‍යවස්ථාවක් ලෙස විවේචනය කර ඇත. කොමියුනිස්ට් පක්ෂය මෙම කනස්සල්ල නැවත අවධාරණය කරන අතර, පීඩාකාරී නීති අහෝසි කිරීමට ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ලබාදී ඇති පොරොන්දුව සහ  මෙම අවස්ථාවේදී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අඛණ්ඩව භාවිතා කිරීම අතර පරස්පරතාව අවධාරනය කරයි.

එබැවින් ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය රජයෙන් සහ අදාළ බලධාරීන්ගෙන් ඉල්ලා සිටින්නේ;

- මේජර් ජෙනරාල් සුරේෂ් සලේට සම්පූර්ණ වෛද්‍ය ප්‍රතිකාර ලැබීම සහ තවදුරටත් අයුතු ලෙස සැලකීමෙන් ආරක්ෂාව ලැබෙන බව, වහාම සහතික කරන්න.
- අධිකරණ වෛද්‍ය නිලධාරියාගේ සම්පූර්ණ වෛද්‍ය වාර්තාව ප්‍රසිද්ධ කර සුදුසුකම් ලත් මධ්‍යස්ථ වෛද්‍ය මන්ඩලයක් විසින් ස්වාධීන වෛද්‍ය පරීක්ෂණයකට අවසර දෙන්න.
- මෙම කාරණය විමර්ශනය කිරීමේදී සහ නඩු පැවරීමේදී නීතිමය ක්‍රියා පටිපාටිය දැඩි ලෙස පිළිපදින ලෙස අප පක්ෂය බලකර සිටින අතර, උපදේශනයට ප්‍රවේශය, ප්‍රමාණවත් ආහාර, සනීපාරක්ෂාව සහ මානුෂීය රැඳවුම් කොන්දේසි සහතික කලයුතුය.
- ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ තවදුරටත් රඳවා තබා ගැනීම දීර්ඝ කිරීම සඳහා විනිවිද පෙනෙන සාධාරණ හේතු ලබා දීම සහ ව්‍යවස්ථාපිත ආරක්ෂණයන්ට අනුකූලව කාලෝචිත අධිකරණ සමාලෝචනයට ඉඩ දිය යුතුය.
- “ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) ඇතුළු සියලු පීඩාකාරී ක්‍රියාවන් අහෝසි කිරීම සහ රටේ සෑම ප්‍රදේශයකම ජනතාවගේ සිවිල් අයිතිවාසිකම් සහතික කිරීමට” ජාතික ජන බලවේගයේ (NPP) 2024 ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් යෝජනාව ක්‍රියාත්මක කරන්න.

කොමියුනිස්ට් පක්ෂය නීතියේ ආධිපත්‍යය, මානව ගරුත්වය සහ සිවිල් අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටී. සැබෑ ආරක්ෂක තර්ජන විමර්ශනය කිරීමට රාජ්‍යයේ වගකීම පිළිගන්නා අතරම, අපයෝජනය, ක්‍රියා පටිපාටිමය අක්‍රමිකතා සහ දේශපාලන වුවමනාවන් වෙනුවෙන් සිදුවන එවැනි  ක්‍රියාවන් පිළිබඳ විශ්වාසදායක වාර්තා ඇති විට පක්ෂය නිහඬව නොසිටිනු ඇත. කොමියුනිස්ට් පක්ෂය මෙම පරීක්ෂණය සමීපව නිරීක්ෂණය කරන අතර, සිවිල් සමාජය සහ මානව හිමිකම් ආයතනවලින් ද එසේ කරන ලෙස ඉල්ලා සිටී.

වෛද්‍ය ජී වීරසිංහ
ප්‍රධාන ලේකම්
2026.06.11